# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/9 - 2021 දෙසැම්බර් මස 13 වැනි සඳුදා - 2021.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත්කිරීම් සිදුකරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියේ නිලධාරී ඉංජි. එම්. ටී. ජී. ඒ. එන්. ලක්මාල් මහතා, 2021.09.07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට.

02. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරී වෛද්‍ය එල්. ඒ. ඒ. එච්. කේ. ද සිල්වා මහතා, 2021.09.28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසරක කාල පරිච්ඡේදයක් සඳහා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරිණී ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, 2021.10.09 වැනි දින සිට ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙක් පත්කරන තෙක් හෝ 2021.12.31 වැනි දින හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමේ කාලය දීර්ඝ කිරීම.

04. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරිණී ආයුර්වේද වෛද්‍ය පී. ජී. ඩී. එස්. ප්‍රේමතිලක මහත්මිය, 2020.08.24 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් වශයෙන්.


1A - PG 5658 — 60 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිණී ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, 2021.11.01 වැනි දින සිට ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙක් පත්කරන තෙක් හෝ 2022.10.31 වැනි දින හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමේ කාලය දීර්ඝ කිරීම.

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි එච්. පී. ඒ. ජී. අනුරුද්ධ මහතා, 2021.12.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට.

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ඩබ්ලිව්. රන්දෙණිය මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2021.12.01 වැනි දින සිට) ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට.

08. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරි ඩබ්ලිව්. රන්දෙණිය මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි, (2021.12.01 වැනි දින සිට) ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් තනතුරේ වැඩ බැලීමට.

09. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එච්. එම්. එම්. ඩී. හේරත් මහතා, 2021.11.22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වියළුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 12 - 0128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.